## 2021/06/15 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2021/06/15 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 12. | එඬේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 13. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 14. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 15. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 16. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 17. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 18. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 19. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 20. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 21. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 24. | කේ.එච්.එම්.නදීකා දර්ශනී මිය | ගරු මන්ත්‍රිනී |

**සහභාගී නොවූ**

| | | |
|---|---|---|
| 01. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 02. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 03. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |

**01.** **ආගම සිහි කිරීම**

2021.06.15 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02.** **මූලාසනයේ පිළිගැනීමේ කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. සියළුම මන්ත්‍රීවරුන් පිලිගැනීමට මත්තෙන් අද දින සභා රැස්වීම මෙසේ පැවැත්වීමට හේතු පහදන්නම්. මන්ත්‍රීවරුනි. දැනට රටේ පවතින කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ රජය විසින් සංචරණ සීමා සහ තවත් සීමා සම්බාධක දැමීම හේතුවෙන්, මෙම මාසයේ සභා රැස්වීම පැවැත්වීමට නියමිත දිනට නොහැකි වූයේ, කොමසාරිස්තුමාගේ උපදෙස් අනුවයි. නමුත් නැවත ගරු ආණ්ඩුකාරතුමාගේ අවසරය පරිදි පවතින සෞඛ්‍ය නීතිරීතිවලට අනුකූලව සභා රැස්වීම පැය භාගයකට සීමා කොට පැවැත්වීමට අද දින යොදා ගැනීමට තීරණය කොට ඔබතුමන්ලාට ලිපි මගින් සහ දුරකථන මාර්ගයෙන් දැනුම් දීමට කටයුතු කළා. එම දැනුම්දීම මත, අද පැමිණි උප සභාපතිතුමා ඇතුළුව සියළුම මන්ත්රීතුමන්ලා. මන්ත්‍රීතුමියන්ලා, මා ඉතා ගෞරවයෙන් පිළිගන්නවා. ඒ සමගම පවසනවා අද දින සභාව පෙර සේ වෙනත් කරුණු යටතේ පැහැදිලි කිරීම් ආදිය නොකොට පැය භාගයක් වැනි කාලයකදී සභාවේ කටයුතු නිමකිරීමට සහයෝගය ලබා දෙන්න කියලා.

**(අ)01. 2021.05.11 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

**නැත**

2021.05.11 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. නාගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුරේ රාජකාර ඉටු කිරීම සඳහා පත් කිරීම - එම්.ඒ.ඩිලානි චන්ද්‍රප්‍රභා මිය යන මැයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත විසින් 2021.05.17 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී

02. සායන කටයුතු සඳහා ඉඩ පහසුකම් සළසා ගැනීම සම්බන්ධව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, උඩුගම විසින් 2021.05.07 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

03. මලාමුර, ඇල්ල රක්ෂිතයේ අනවසර ඉදි කිරීමක් සම්බන්ධව සනත් විජේරත්න, මලාමුර. මාපලගම මධ්‍යම විසින් 2021.05.12 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

04. 214 අලුත් ඉහළ. කොවුලාන මාර්ගයේ ජලය බැස යන කාණුව අවහිර කිරීම සම්බන්ධව ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.ගයාන් මධුසංඛ මහතා විසින් 2021.05.31 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

05. 214 ඒ මලාමුර මල්ලකන්ද පාර මාර්ගය සංවර්ධනය කර ගැනීම සම්බන්ධව ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ජී.ගයාන් මධුසංඛ මහතා විසින් 2021.05.31 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

06. සිලිංඩර් ලබා ගැනීම සම්බන්ධව ඒ.එම්.ශ්‍රියාවතී, ප්‍රාදේශීය රෝහල, ගා/නාගොඩ විසින් 2021.05.03 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

07. නිවසට පස් කන්දක් කඩා වැටීම සම්බන්ධව යූ.ජී.සුමනදාස මයා . ඇටිකෙසෙල්කන්ද, උඩුගම නැගෙනහිර විසින් ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා මගින් 2021.06.14 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

08. සිදු වූ අසාධාරණයක් පිළිබඳ දැනුම්දීම යන මැයෙන් ඒ.ඒ.රංජිත්, ඇටිකෙසෙල්කන්ද, උඩුගම නැගෙනහිර විසින් 2021.06.10 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

09. තුන්හවුල්කැල්ල. මහගෙදරවත්ත පාර සම්බන්ධව ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් 2021.06.02 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

10. අනාරක්ෂිත ලෙස කණ්ඩිය කැපීම සම්බන්ධව යූ.ජී.සමන් ගාමිණී උඩුගම දකුණ, උඩුගම විසින් 2021.06.15 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**(ඈ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

01. නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කොම්පෝස්ට් අංගනය පිහිටි අක්කර 05 ක භූමිය රජයේ මැණුමකින් වෙන් කර දී ඇති බැවින් එහි මායිම වටා වැටක් ඉදිකිරීමටත්, එම භූමිය එළිපෙහෙලි කිරීමට ස්කවේටර් යන්ත්‍රයක් යොදා ගැනීමටත් එමගින් ඉවත් වන දර නීත්‍යානුකූලව විකිණීමටත් යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එන්.ඩබ්ලිව් පතිනායක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. හදිසි ආපදා තත්වයක් පවතින මේ කාල වකවානුව තුල සෞඛ්‍ය කටයුතු සඳහා වෙනත් අත්‍යාවශ්‍ය කටයුතු සදහාත් ප්‍රාදේශීය සභා පොදු අරමුදල මගින් රු. 200000.00 ක පමණ මුදලක් වියදම් කිරීමට සභා ආවරණ අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

(ඉ). 1.1 (සභා රීති 11/8 යටතේ කරනු ලබන හදිසි යෝජනා)

**01.** නාගොඩ ප්‍රාදේශීය සභාව සඳහා අනුමත වී ඇති තල්ගස්වල නගරයේ වෙළඳ සංකීර්ණය ඉදි කිරීම සඳහා වළකුඹුර ආදාහනාගාරය ඉදි කිරීම යන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුතුමාගේ උපදෙස් පරිදි පහත නමු සඳහන් තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත් කරන අතර ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කරමි.

**තාක්ෂණ ඇගයීම් කමිටුව**

- ප්‍රධාන ඉංජිනේරු, ඕ.සී.ජයනන්දන මයා, - පළාත් පාලන දෙපාර්තමේන්තුව
- ඉංජිනේරු සහකාර උපුල් ජයසිංහ මයා - පළාත් පාලන දෙපාර්තමේන්තුව
- සැළසුම් ශිල්පී රවීන්ද්‍රී ගුණසේකර මිය - පළාත් පාලන දෙපාර්තමේන්තුව
- සැළසුම් අධ්‍යක්ෂ කෝරළගේ මයා - පළාත් පාලන දෙපාර්තමේන්තුව
- තාක්ෂණ නිලධාරී කුසල් අසංක එදිරිසිංහ මයා - නාගොඩ ප්‍රාදේශීය සභාව

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එන්.ඩබ්ලිව් පතිනායක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු සභාපතිතුමා පැහැදිලි කරමින්,**

විශේෂයෙන්ම කියන්න ඕන. අපි බලාපොරොත්තු වුන ආදාහනාගාරයේ මුදල් සියල්ල වෙන් වෙලා. ඒක දැන් ඊයෙ පත්තරේ ටෙන්ඩර් දැන්වීම පළවුනා. **ආදාහනාගාරය ඉදිකිරීම ප්‍රසම්පාදන දැන්වීම නාගොඩ ප්‍රාදේශීය සභාව** ඊයෙ පත්තරේ ඒක ටෙන්ඩර් කරන්න දාල තියෙනවා. ඊලගට නාගොඩ ප්‍රාදේශීය සභාවෙ තල්ගස්වල ඉදිකිරීමට නියමිත වෙළඳ සංකීර්ණ බිල්ඩින් ඒකත් ටෙන්ඩර් කරන්න 2021.06.14 ඊයෙ දිනමිණ පත්තරේ දාල තියෙනවා.

- ප්‍රසම්පාදන දැන්වීම නාගොඩ ප්‍රාදේශීය සභාව ආදාහනාගාරය ඉදිකිරීම - ලංසු ඉදිරිපත් කළයුතු අවසාන දිනය 2021 ජුනි 25 වන දින නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් වැඩ විෂය සඳහා 2021.06.25 වන දින පෙ.ව. 10.00 දක්වා මුද්‍රා තබන ලංසු පත් භාරගනු ලැබේ. එදිනම එම වේලාවටම එම කාර්යාලයේ ටෙන්ඩර් කරුවන් ඉදිරියේ ලංසු පත් විවෘත කරනු ලැබේ.
- ප්‍රසම්පාදන දැන්වීම නාගොඩ ප්‍රාදේශීය සභාව තල්ගස්වල නගරයේ වෙළඳ සංකීර්ණය ඉදිකිරීම පළමු අදියර- ලංසු ඉදිරිපත් කළයුතු අවසාන දිනය 2021 ජූලි 05 වන දින නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් වැඩ විෂය සඳහා 2021.07.05 වන දින පෙ.ව. 10.00 දක්වා මුද්‍රා තබන ලංසු පත් භාරගනු ලැබේ. එදිනම එම වේලාවටම එම කාර්යාලයේ ටෙන්ඩර් කරුවන් ඉදිරියේ ලංසු පත් විවෘත කරනු ලැබේ.
- මේ කර්මාන්ත දෙකේම ටෙන්ඩර් පත් විවෘත කරන්නෙ මේ ස්ථානයෙදි. සභාපති ප්‍රාදේශීය සභාවෙ සභාපති. අපේ සභාවෙ මන්ත්‍රීවරුන්ගෙ ටෙන්ඩර් කමිටුව තමයි මේ කර්මාන්ත දෙකේම ටෙන්ඩර් කමිටුව. වෙන කවුරුවත් නැහැ. තාකෂණ කමිටුවට මම කලින් කියපු අය පත්කරන්න ඕන.

**09. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 22 දක්වා ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.**

**<u>2021.06.15 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.</u>**

**01.ලංකා විදුලිබල මණ්ඩලය**

**2021 මැයි මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු. 258.30 |
| 8616373802 | - උඩුගම පොළ | - රු. 240.00 |
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු.4906.50 |
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 313.20 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 240.00 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 935.40 |
| 4501090200 | - මාපලගම වෙලද සංකීර්ණ කොරිඩෝව | - රු. 514.50 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු.1502.70 |

**2021 අප්‍රේල් මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු. 349.80 |
| 8616373802 | - උඩුගම පොළ | - රු. 240.00 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු.1136.70 |
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු. 7552.00 |
| 8619142704 | - රන්කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 240.00 |
| 4501090200 | - මාපලගම වෙලද සංකීර්ණ කොරිඩෝව | - රු. 276.60 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 240.00 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 679.20 |

**2021 මාර්තු මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 8619142704 | - රන්කැකුළු පෙර පාසල | - රු. 240.00 |

**02. 2021 මැයි මස දුරකථන බිල්පත්**

**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

| | | | |
|---|---|---|---|
| i. | 0912231201 | - සභාපතිතුමාගේ නිවස | - රු. 4186.08 |

**2021 අප්‍රේල් මස දුරකථන බිල්පත්**

**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

| | | | |
|---|---|---|---|
| ii. | 0912231201 | - සභාපතිතුමාගේ නිවස | - රු. 4247.38 |
| iii. | 0912296577 | - මාපලගම උප කාර්යාලය | - රු. 422.98 |
| iv. | 0912296537 | - සභාපතිතුමාගේ නිල කාමරය | - රු. 2957.47 |
| v. | 0912296433 | - ප්‍රධාන කාර්යාලය | - රු. 4829.71 |

**<u>03 .2021 මැයි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | |
|---|---|---|
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 2000.00 |
| කේ.එල්.එන්.ප්‍රමෝද මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 2000.00 |
| අනුෂා සමරවික්‍රම මෙය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 1000.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු . 2500.00 |
| මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 3200.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | - රු. - |

**<u>04.ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - සභාපති | - රු. 2000.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 3500.00 |

| | | |
|---|---|---|
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 350.00 |

**05. අතිකාල දීමනා ගෙවීම්**

**2021 මැයි මස**

| | | |
|---|---|---|
| චන්දිමා සෙනවිරත්න මිය | - කළමනාකරණ සහකාර | - රු. 498.00 |
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 9046.04 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 8346.00 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 8312.00 |
| එන්.එම්.රජිත මයා | - අනියම් මුරකරු | - රු. 8080.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8560.00 |
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු.11116.00 |
| පී.කේ.චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 6588.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 8560.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 8507.00 |
| හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 8480.00 |
| අයි.කේ.ඉන්දික මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 2704.00 |
| කේ.එම්.එම්.නිශාන්ත ඉඳුනිල් මයා | - රියදුරු | - රු. 8560.00 |
| කේ.පී.ජී. ප්‍රසන්න මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 624.00 |
| ජී.එල්.උපුල් ධර්මසිරි මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 2912.00 |
| රංජිත් උදය කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 6366.00 |
| එස්.ඩී.එම්.කැටිපෙආරච්චි | - විදුලි කාර්මික නිළධාරී | - රු. 2073.00 |

**06. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**2021 අප්‍රේල් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 597ක් | - රු. 62088.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 180 ක් | - රු. 18720.00 |
| LL 7366 ට්‍රක් බවුසර් රථය ඩීසල් ලීටර් 250 ක් | - රු. 26000.00 |
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 160 ක් | - රු. 16640.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 80 ක් | - රු. 8320.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 160 ක් | -රු. 16640.00 |
| LO 3592 ලොරි බවුසරය සඳහා ඩීසල් ලීටර් 130 ක් | - රු. 13520.00 |
| DS 190 ජියර් ඔයිල් ලීටර් 10 ක් Oil 1L | - රු. 7500.00 |
| තණකොළ කපන යන්ත්‍රය සඳහා පෙට්‍රල් ලීටර් 25 ක් | - රු. 3425.00 |
| ගබඩාව 2T Oil ලීටර් 1 | - රු. 600.00 |
| **එකතුව** | **- රු.173453.00** |

**07. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. 2021 මැයි මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත - රු.81000.00

ii. COVID 19 වසංගත තත්වය හේතුවෙන් නිරෝධායනයට ලක් වූ ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනෙවියගේ නිවස සඳහා සහන බඩු ලබා දීමේ වියදම ප්‍රතිපූරණය කිරීම - රු.5000.00

**08. එම්.ඒ.සිරිපාල මයා, සේසිරි ස්ටෝර්ස්, මාපලගම**

2021.05.11 දිනැති මාසික සභා වාරය සඳහා සංග්‍රහ කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත - රු. 5480.00

**09.**වැඩ බලන ලේකම්, එම්.ඒ.ඩිලානි චන්ද්‍රප්‍රභා මිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක SP/PSC/07/01/08 (76) හා 2021.05.17 දිනැති ලිපිය අනුව ලේකම් තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් 2021 මැයි මස දීමනා ගෙවීම - රු. 10395.00

**10.** එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ
නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා ජූනි මස මාසික කුලීය ගෙවීම - රු. 5000.00

**11.** එම්.ජේ. ජනිත් ඉරේෂ් කුමාර මයා, වදුරඹ
i. ප්‍රාදේශීය සභාවේ 2021.05.11 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත (කෑම සඳහා) - රු. 7135.00

**12.**කේ.ජී.ඒ. දිනේෂ් සම්පත් මයා, කුරුපනාව
තල්ගස්වල පොළ භූමියේ සත්රේ කැබින් වෙළඳ ආයතනයට අවහිරයක්ව පැවති කැන්ද සහ අලිගැටපේර ගස් කපා ඉවත් කිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම - රු. 5000.00

**13.** ආසිරි ටයර් ට්‍රේඩර්ස් ඇන්ඩ් ඔටෝ සර්විස් , ඇතුමලේ
PF 7360 කැබ් රථයේ ඉදිරිපස දකුණු පැත්තේ පොට්ලයිට් බල්බ් එකක් ලබා ගැනීමේ බිල්පත පියවීම - රු. 480.00

**14.** විගණකාධිපති, විගණන කාර්යාලය
i. හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10000.00

**15.** යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2021 මැයි) - රු.14500.00

**16.**අනුර අයන් වර්ක්ස්, උඩුගම
නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් වෙළඳ සංකීරණයේ උඩුමහලේ දොර දෙකට කපා දොරවල් 2 කට සවි කිරීම - රු. 28000.00

**17.**ජයවර්ධන ට්‍රේඩර්ස්, ගිංතොට
ප්‍රධාන කාර්යාලයේ ප්‍රින්ටර් සඳහා ටෝනර් ලබා ගැනීමේ බිල්පත - රු. 37000.00

**18.** ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්
i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2021 මැයි මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු28500.00
ii. 2021 මැයි මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 2100.00

**19.** අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල
PF 7360 කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු.18920.00

**20.** දස මස් වැටුප් අත්තිකාරම්
කේ.කේ.අවන්ත පද්ම මයා, කාර්යාල කාර්ය සහායක - රු.250000.00

**21.** ලෙස්ලි සිරිවර්ධන, වළකුඹුර

ගං වතුර හදිසි ආපදා තත්වය නිසා ජනතාවගේ යට වූ ලිං ඉසීම සදහා අවශ්‍ය
ගිල් වන මෝටර් ලබා ගැනීම සදහා වැය වූ වියදම -රු. 5000.00

**22.** එච්.කේ.ආරියදාස,නාගොඩ
ගංවතුර ආපදා තත්වය මත යට වූ ළිං ඉසීම සදහා කුලී පදනම මත මෝටරයක් -රු. 6000.00
ලබා ගැනීමේ බිල්පත පියවීම

**ඉදිරි ගෙවීම් වාර්තාවේ අංක 05 අතිකාල දීමනා යටතේ සදහන් අනුර දිසානායක මයා ගේ ගෙවීම හැර අනිකුත් ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම
2021.06.15 දින පැවැත්වෙන මාසික සභා රැස්වීමට ඉදිරිපත් කරනු ලබන ආවරණ අනුමැතිය යටතේ කල ගෙවිම් පිළිබඳ විස්තරය

1. යුනයිටඩ් ෆාමා,

කොවිඩ් 19 මර්ධන කටයුතු සඳහා හදිසි අවශ්‍යතාවයන් මත sanitizer - 5*L* ක් සහ
pp kit 10 ක් මිල දී ගැනීම වෙනුවෙන් රු.11750.00

2. හදිසි ගංවතුර ආපදා තත්වය නිසා බල ප්‍රදේශයේ යට වු ළිං ඉසිමට වතුර මෝටර් ලබාගැනිමේ බිල්පත් පියවීම

| | | | |
|---|---|---|---|
| ටි.එල්.තිස්ස කුමාර | (දින 05) | - | රු. 10000.00 |
| ජී ඒ ක්‍රිෂාන්ත | (දින 03) | - | රු. 4500.00 |
| මලිෂ යසස් ප්‍රමෝදය | (දින 04) | - | රු. 9000.00 |
| ඩබ් චමිත් විදුරංග | (දින 04) | - | රු. 4000.00 |
| දර්ශි චින්තනමාලි රූපතුංග ඇපා | (දින 05) | - | රු. 5000.00 |
| එන් වී තුෂාරි ප්‍රියංගිකා | (දින 04) | - | රු. 6000.00 |
| ඩබ් ඒ කේ ජනක අසංක | (දින 02) | - | රු. 4000.00 |

3. ඩබ් ප්‍රේමවති

හදිසි ගංවතුර ආපදා තත්වය හේතුවෙන් ආපදා සහන

සැපයිමේ සේවකයින් වෙනුවෙන් ආහාර ලබාදීම වෙනුවෙන්

කෑම පැකට් 256*රු.150 රු: 38400.00

**ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් සහා අරමුදල් මගින් දැරීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ).2** කර්මාන්ත යෝජනා
**(ඉ) 2.** ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී බන්දුල සමන්ත හිරිමුතුගොඩ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01.රණවිරුගම කොස්ගහ බංගලාව පාර කාණු කපා සංවර්ධනය කිරීම

**ගරු මන්ත්‍රී බන්දුල සමන්ත හිරිමුතුගොඩ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. උඩුගම 218 ඩී උක්ඕවිට 59 හේන බටහේන්ගොඩ මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීම සඳහා ජේ.සී.බී යන්ත්‍රයක් සංවර්ධනය කිරීමට යෝනා කරමි.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

01. කැප්පිටියාගොඩ උතුර පියසෙන් ගම්මානයේ අතුරු මාර්ගයක් වන සමන් මහතාගේ නිවසේ පිටුපස සිට එම්.කේ.ලීලාවතී මියගේ නිවස අසළ දක්වා බැකෝ යන්ත්‍රයක් යොදාගෙන සංවර්ධනය කිරීම - රු. 75000.00
02. 212 බී කැප්පිටියාගොඩ දකුණ ග්‍රාම සේවා වසමට අයත් නාගොඩ වත්ත ප්‍රධාන මාර්ගයේ ගණදෙවි කෝවිල අසළ සිට මාර්ගය සංවර්ධනය කිරීම - රු.125000.00
03. උඩුගම සතිපොලේ නව කඩ කාමර ඉදි කිරීම (2 අදියර) ඍජු ශ්‍රමික-රු. 500000.00
04. උඩුගම 59 කන්ද මාර්ගයේ නාය යාම සිදු වී ඇති ස්ථානවල පස් ඉවත් කිරීම - රු. 20000.00
05. උඩුගම 72 කන්ද මාර්ගයේ නාය යාම සිදු වී ඇති ස්ථානයේ පස් ඉවත් කිරීම - රු. 65000.00
06. උඩලමත්ත බණ්ඩාරනායකපුර බණ්ඩිහේන මාර්ගයේ (කාපට් කරන මාර්ගය) කැටගල් ඉවත් කිරීම - රු. 30000.00
07. රණවිරුගම කොස්ගහබංගලාව මාර්ගයේ කාණු කපා සංවර්ධනය කිරීම - රු. 30000.00
08. උඩුගම නැගෙනහිර ගල්බැදිදොළ හරහා ජනසවිය ගම්මානයට යන මාර්ගයේ පාලම අසළ මාර්ග කොටස සකස් කිරීම - රු. 25000.00
09. උඩුගම අලුත්වත්ත කැකිල්ලකන්ද මාර්ගය සංවර්ධනය කිරීම -රු. 250000.00
10. උඩුගම 24 කණුව ගලගෙදර අසළ කැටගොඩ නාය යාම සිදු වූ ස්ථානයේ පස් ඉවත් කිරීම - රු. 65000.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**(ඊ) කාරක සභා වාර්තා**

(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා

(ඌ) වෙනත් කරුණු :-

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

ගරු මන්ත්‍රීවරුනි මේ තියෙන වසංගත තත්වයත් එක්ක. අද අපට මේ සභාව පැය භාගයකට සීමා කරන්න කියල තමයි උපදෙස් දුන්නෙ. ගරු මන්ත්‍රීවරුනි, අද පැන නැගුන ප්‍රශ්න පිළිබඳව. මම ලබන සභා වාරෙදි ඒ සියල්ලටම පිළිතුරු ලබා දෙන්නම්. අද වෙනත් කරුණු යටතේ කතා කිරීම සඳහා අවස්ථාව ලබා දීමට හැකියාව නොමැති වුනත්. අපේ විපකෂ නායකතුමා විසින් ඉල්ලීම් කරන ලද නිසා. ඒතුමාට විනාඩි කිහිපයක් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, දීර්ඝ වශයෙන් කාලය ගන්නෙ නැහැ. මම මේ කියන්නෙ මගේ විතරක් නොවන සමස්තයට සිදු වූ ප්‍රශ්නයක් සම්බන්ධව. සභාපතිතුමාටත් මේකෙ වගකීමක් තියෙනවා. පහුගිය මැයි මස 31 වෙනිදත්, ජුනි මස පළවෙනිදත් එන්නත් ලබා දුන්නා. මෙතනදි මම මැයි 31 වෙනිදා ගැන කතා කරනවා. සමහර විට මට මේ වාර්තාව අවශ්‍ය වෙයි. සමහර වෙලාවට මේ සම්බන්ධව සභාපතිතුමා දන්නෙ නැහැ කියන්න පුලුවන්. සභාපතිතුමා දන්නෙ නැහැ කියනවනම් ඒක ඔබතුමාගෙ දුර්වලතාවයක්. පනත ගෙනාවොත් මම දැන් ඕනනම් වගන්තිත් එක්ක පැහැදිලි කරන්නම්. තමුන්නාන්සෙ තමයි බලධාරියා. බල්ලෙක් මැරුණත්, හරකෙක් මැරුණත් වලලාන්න කියලා සභාපතිට කෝල් කරනවා. ඒක වෙන කාටවත් කියන්නෙ නැහැ. ප්‍රාදේශීය ලේකම්ටවත් MOH ටවත් කියන්නෙ නැහැ. එතකොට මේ ප්‍රදේශයේ සෞඛ්‍ය ආරක්ෂා කිරීමේ වසංගත රෝගවලින් ආරකෂා කිරීමේ ප්‍රධාන නියමුවා හැටියට ඉන්නෙ ඔබතුමා. මැයි මාසෙ 31 වෙනිදා පළවෙනි කොරෝනා එන්නත දෙන්න සූදානම් කළා. ඒක බොහොම ලස්සනට කුමන්ත්‍රණකාරී ලෙස, තමුන්නාන්සෙ දන්නවද නැද්ද මම දන්නෙ නැහැ. මැයි 31 වෙනිදා මේක කුමන්ත්‍රණය කරලා, මම දන්න විදිහට මේ කුමන්ත්‍රණය කළේ වෛද්‍ය අධිකාරීවරයා ඇතුලු කණ්ඩායමක් තමයි. එතකොට මේ සඳහා නාගොඩ කොට්ඨාසය තෝරගත්තා. ඒකයි දුක තියෙන්නෙ. මේකට බද්දෙගම කොට්ඨාසය තෝරගත්තනම් අපට ප්‍රශ්නයක් නැහැ. නාගොඩ බල ප්‍රදේශය තෝරගෙන පරණතානායම්ගොඩ සහ කැප්පිටියගොඩ ග්‍රාම සේවා වසම් දෙක තෝරගත්තා. මේක උපක්‍රමයක්. උපක්‍රමයක් හැටියට මෙතනට එන්නත් ටික ගෙනැල්ලා, මම හිතන්නෙ පරණතානායම්ගොඩ කොට්ඨාසෙ දෙසීය ගණනක් විතර එන්නත් ලබා දුන්නා. ඊට පස්සෙ කැප්පිටියගොඩත් මම හිතන්නෙ ඒ වගේම ප්‍රමාණයක් ලබා දුන්නා. එතකොට ප්‍රාදේශීය ලේකම්වරිය සමගම මේක සතියකට කලින් සැලසුම් කළා, මේකට මට ඔබතුමාට ඇගිල්ල දික්කරන්න බැහැ. සමහරවිට ඔබතුමාට ඇන්දුවා. මම ඒ වචනෙ කියනවා. ගරු මන්ත්‍රීවරුනි, අපි හිතමු මේ සභාවට වතුර බෝතල් 27 ක් ගෙනාවා. එතකොට ඒ 27 සභාවට ගෙනාවට පස්සෙ, අද දවසේ වතුර බෝතල් 27 ක් ගෙනාවා කියලා පොතේ සටහන් වෙන්න ඕන. ඒක නිසා මේ කොට්ඨාස දෙක තෝරගෙන. MOH ඇතුලු වෛද්‍යවරු මොකද කරන්නෙ? එයාලගෙ හත්මුතු පරම්පරාවටම, හතර වරිගයටම මේ මුදලිගේ ශාලාව තෝරගෙන. මේ ප්‍රදේශයේ විතරක් නෙවෙයි. හරියට සිංහලෙන් කියනවනම්, දෙවුන්දර තුඩුවෙ ඉඳලා පේදුරු තුඩුව දක්වා එයාලගෙ ඔක්කොම ආවා. එතකොට බහුතරයක් පිට වුනේ අධිවේගී මාර්ගයේ නයා පාමුල පිටවුමෙන්. ඒ පිටවෙන කොට

මේ කිසි දෙයක් නොදන්නා යම්කිසි කෙනෙක් මේ වාහන ටික යනකොට බලාගෙන ඉඳලා තියෙනවා. මේ සිද්ධිය ආරංචි වුනාට පස්සෙ එක පෙළට වාහන 42 ක් ගිය බව ඒ පුද්ගලයා මට කිව්වා. මේ වාහනවලින් පැමිණි සියළු දෙනාම මේ ස්ථානයෙන් එන්නත ලබා ගත්තා. අපට ප්‍රශ්නයක් නැහැ. අපි හිතමු ඒක වියසනය නිසාය කියලා. නමුත් නාගොඩ කැප්පිටියගොඩ පරණතානායම්ගොඩ මේ අල්ලපු ගෙදර මනුස්සය බලාගෙන ඉන්නවා. ඒ කිසිම කෙනෙකුට එන්නත ලබාගන්න බැරි වුනා. ඒක නිසා මේ කොට්ඨාසයේ තමුන්නාන්සෙ බලධාරියා හැටියට මම දන්නෙ නැහැ ඒ වෙලාවෙ ගත්ත තීන්දුව මොකක්ද කියන එක. පස්සෙ හවස් වෙන කොට ගෙනාපු එන්නත් ප්‍රමාණය ඉතුරු වුනා. එයාලයි ප්‍රමාණය දීලා, අන්තිමට මෙතනට ගෙදර වැඩකරන පුද්ගලයගෙ ඉඳලා සියළු දෙනා ආවා. ප්‍රදේශයෙන් පරිබාහිර එයාලගෙ සියළු දෙනා මෙතනට ගෙනැල්ල එන්නත්කරණය කළා. ඒක ප්‍රාදේශීය ලේකම්වරියගෙන් විමසන කොට කියනවා. ඔව් අඩුපාඩුවක් සිදු වුනා කියලා. මේ අඩුපාඩුව වහගන්න, ඊට පස්සෙන්දම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ටත් එන්නත්කරණ වැඩසටහනක් දාලා මන්ත්‍රීවරුන්ටත් අන්දන්න හැදුවා. ප්‍රාදේශීය සභාවෙ මන්ත්‍රීවරුන්ටත්, ප්‍රාදේශීය සභාවෙ නිලධාරීන්ටත්, ග්‍රාම නිලධාරීන්ට, හැබැයි මම මෙතනදි පී.ඒච්.අයි මහත්වරු නිදහස් කරනවා. මහජන සෞඛ්‍ය නිලධාරී මහත්වරු එතුමන්ලගෙ නෝනටවත්, එතුමන්ලගෙ දෙමව්පියන්ටවත් මේ ස්ථානයෙන් එන්නත් ලබා ගැනීමට කටයුතු කලේ නැහැ. කොට්ඨාසෙ බල ප්‍රදේශයේ වැඩකරන. බහුතරයකට එන්නත් කරගන්න බැරි වුනා. සමහරවිට ඇත්තටම ඒ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉන්න, මේ ප්‍රදේශයේ අපිත් ඒක්ක වැඩකරන පී.ඒච්.අයි මහත්වරුන්ටත් මේකෙ ප්‍රතිඵලයක් ආවෙ නැහැ. එයාලටත් ඇන්දුවා. එහෙමනම් අද මේ මොහොත වෙනකොට ගාල්ලෙ උණවටුනෙ එන්නත්කරණය සම්බන්ධව පරීක්ෂණ සිදු වෙනවා. උණවටුන සහ නාගොඩ ප්‍රදේශයේ සිදු වූ සිදුවීම් ගැන ලැජ්ජයි. මම ගෙදර හිටියෙ. මට හවස් වෙනකොට ආරංචි වුනා. නාගොඩ එන්නත් දෙනවයි කියලා. යම් පුද්ගලයෙක් පාරෙ යන ගමන් එන්නත විදගෙන ඇවිල්ලා කියනවා. එන්නත් විදිනවයි කියලා. එතකොට තමයි අපි සිද්ධිය දන්නෙ. ඒක නිසා මේ වෙලාවෙ මේ වගකීමෙන් කොටසක් තමුන්නාන්සෙට භාරගන්න සිදු වෙනවා. යම්කිසි ලොකු වගකීමක් වසංගතයක් ආවම. ඒ වසංගතය වෙනුවෙන් සෞඛ්‍ය පහසුකම් සැලසීමේ නියමුවා හැටියට තමුන්නාන්සෙ ඉන්න ඕන. සෞඛ්‍ය අධිකාරියත්, ප්‍රාදේශීය සභාවත්, සභාපතිවරයත් එකතුව කමිටුවක් හැදිලා, ඒ කමිටුව තීරණය කරල තමයි මේ දේ ක්‍රියාත්මක විය යුත්තේ කියන එක ඒ පනතෙම තියෙනවා. නමුත් ඒ ගැන තමුන්නාන්සෙ දන්නෙ නැහැ. මම කණගාටුවෙනවා.

ඊලගට මේ සිද්ධිය පළවෙනිද වුනා. මොකක්ද වුනේ. ප්‍රදේශීය සභා මන්ත්‍රීවරයා වෙනුවෙන් පෙනී සිටින්න සභාපතිවරයාට අයිතියක් තියෙනවා. නමුත් මෙතුමා පෙනී හිටියට ප්‍රාදේශීය ලේකම්වරියගේ අවශ්‍යතාවය අනුව තමයි සියළු දේ සිදු වුනේ. මම මට හිමි ඒ එන්නත මගේ භාර්යාවට ලබා දෙන්න කටයුතු කළා. නමුත් කරන්න බැහැ කිව්වා. මට ලැබිච්ච දේ මට කණගාටු ඒකයි. ඒ විතරක් නෙවෙයි ධනංජය මන්ත්‍රීතුමා, එතුමාට හිමි එන්නත තමන්ගේ මෑණියන්ට ලබා දෙන්න කියලා ඉල්ලීමක් කළා. ඒත් බැහැ කිව්වා. තමුන්නාන්සෙ හිතන්න තමුන්නාන්සෙ ගැන. පොඩ්ඩක් ඔය හැම මන්ත්‍රීවරයෙක්ම හිතන්න. තමුන්නාන්සෙගෙ එන්නත තමුන්නාන්සෙ ගිහිල්ලා මට එපා. මම දේවත්වයෙන් සලකන්නෙ මගේ අම්මා. ඒ එන්නත අම්මට දෙන්න කියලා කියනවනම්. ඒක බැහැයි කියන්න තරම් අද නිලධාරි පෙළඹිලා තියෙනවා. තමන්ට ලැබිච්ච දේ. ඒක නෙවෙයි කණගාටුව. එහෙම කියලා විනාඩි ගණනක් ගියෙ නැහැ. ගරු සභාපතිතුමනි, පොලීසියෙ නිලධාරි මහත්වරුත් නෝනලාත් එන්නත් කළා. මොකක්ද මේ නීතිය. ඇස්පනාපිට පෙනි පෙනී පොලීසියෙ නිලධාරීන්ටත්. නෝනලාටත් එන්නත් දෙනවා. මම ඒකත් ගිහිල්ලා ඇහුවා. ඒක ඇහින් දැකලා, නන්දන මන්ත්‍රීතුමා මගේ ලගට ඇවිල්ලා එන්නත් ලබා දුන් ආකාරය ගැන කිව්වා. එතකොට ඒක ඇහුවම ප්‍රාදේශීය ලේකම් තුමිය කියනවා. ඒ එන්නත ලබා දුන්නෙ නිරෝධායනය වෙච්ච කෙනෙකුටය කියලා. කිසිම සම්බන්ධයක් නැති අය හා නිලධාරීන්ගේ බිරින්දෑවරු ඇවිල්ලා එන්නත ලබා ගත්තත්. මම ප්‍රාදේශීය සභාවෙ මහජන නියෝජිතයෙක් හැටියටත්, සභාපති හැටියට,

තමුන්නාන්සෙත් ඉල්ලීම කළා. නමුත් එන්නත ලබා දෙන්න බැරි වුනා. එහෙමනම් තමුන්නාන්සෙ එතන දුර්වලයි කියන එක තමයි මට කියන්න තියෙන්නෙ. ඒක නිසා මම හිතනවා. මේ වගේ කණගාටුදායක තත්වයක් මේ කොරෝනා වසංගතයත් සමඟ මේ ප්‍රදේශයේ සිදු වුනා. එන්නත්කරනය සම්බන්ධව අද ගාල්ලෙ පරීක්ෂණ කරනවනම්, මේකට සම්බන්ධ වෙන්න මගේ බලාපොරොත්තුවක් තියෙනවා. මම මේක හෙළි කරනවා. වෛද්‍ය අධිකාරිගෙන් තොරතුරු ඉල්ලන්න තමුන්නාන්සෙට අයිතිය තියෙනවා. 31 වෙනිද එන්නත් කීයක් පාවිච්චි කළාද? මේ සභාවෙ මම ඉල්ලන්නෙ තමුන්නාන්සෙට සහයෝගයක් හැටියට. සටහන් කරල තියන්න. 31 වෙනිදා පාවිච්චි කරපු එන්නත් ප්‍රමාණය කොපමණද? ප්‍රදේශයෙන් පරිභාහිරව එන්නත් කීයක් ලබා දුන්නාද? ප්‍රදේශයේ එන්නත්කරනයට හසු වුනේ ග්‍රාම සේවා වසම් දෙකයි. ඒ එන්නත්කරනයට හසු වෙච්ච ප්‍රමාණය එකතු කරලා, වෛද්‍ය අධිකාරියෙන් ඉල්ලන්න. මෙහේට එන්නත් කීයක් 31 වෙනිද නිකුත් කළාද? ප්‍රදේශයේ තමුන්නාන්සෙගෙ ජනතාවට තමුන්නාන්සෙගෙ සහොදරයින්ට තමුන්නාන්සෙගෙ ඥාතීන්ට අපේ සියලු දෙනාගේ ඥාතීන්ටයි මේක දෙන්න තිබුනේ. එතකොට MOH කාර්යාලයෙන් හා ප්‍රාදේශීය ලේකම්වරියගෙන් මෙන්න මේ වරද නාගොඩත් සිදු වුනා කියන එක මම නිර්භයව ප්‍රකාශ කරනවා. ඉහතින් මම සඳහන් කල තොරතුරු ඇතුලත් වාර්තාව මට ලබා දෙන්න. මම එතන ඉදලා මේකෙ කළ යුතු දෙයක් ඇත්නම්, ඒක කරන්න සූදානම් වෙනවා. එහෙනම් මීට වැඩිය කාලය ගන්නෙ නැහැ. තමුන්නාන්සෙලට සියලු දෙනාටම ස්තුති කරමින්, මා නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුලු ගරු මන්ත්‍රීවරුනි, වෙනත් කරුණු යටතේ අදහස් ප්‍රකාශ කිරීමට ගරු මන්ත්‍රීවරුන්ට අවස්ථාව නොදීමට මුලදී තීරණය කළත්, විපක්ෂ නායක චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමාට විශේෂ ප්‍රකාශයක් කිරීමේ අවශ්‍යතාවය ප්‍රකාශ කළ නිසා එතුමාට පමණක් ඉඩ ලබා දීම පිළිබඳව අනිකුත් මන්ත්‍රීතුමන්ලා මා සමඟ උරණ නොවනු ඇතැයි සිතනවා. එතුමාගේ එම කරුණු පැහැදිලි කිරීම අනුව, අපගේ මහජන නියෝජිතයන්ට එන්නත්කරනයේදී යම් අපහසුතාවයකට පත්වීමට සිදුවීම පිළිබඳව මා අතිශය කණගාටු වනවා මෙන්ම, මගෙන් යම් අඩුපාඩුවක් වූයේ නම් ඒ පිළිබඳවත් සමාව ඉල්ලනවා. මන්ද ගරු මන්ත්‍රීවරුනි, මෙම එන්නත් දීම පිළිබඳව මා සභාපති හැටියට දැනගත්තේ ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් සහ උඩුගම වෛද්‍ය අධිකාරීතුමාගෙන්. පසුව ගරු අමාත්‍ය රමේෂ් පතිරණ ඇමතිතුමාගේ කාර්යාලයෙන්, ගරු සම්පත් අතුකෝරල මන්ත්‍රීතුමාගේ කාර්යාලයෙන් සහ පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් කතා කොට අපගේ සභාවේ සෞඛ්‍ය කම්කරු, වැඩ/ක්ෂේත්‍ර කම්කරු, ක්ෂේත්‍ර නිලධාරීන් සහ මන්ත්‍රීවරුන්ගේ නම් ලයිස්තුව ඉතා කඩිනමින් ඉල්ලා සිටියා. ඒ අනුව මම ක්ෂණිකව ලේකම්තුමිය මාර්ගයෙන් අවශ්‍ය ලේඛනය එම ආයතනවලට යැව්වා. නමුත් ඊට එහා සිදුවීම පිළිබඳව මට වැටහීමක් නැහැ. චීනයෙන් එන්නත් 125000 ක් පමණ ලැබුන බවත්, ඒ එන්නත් ප්‍රමාණයෙන් 50000 ක් දකුණට ලබා දෙනවා කියලා අපි මීට දවස් කිහිපයකට පෙර දැනගත්තා. එම එන්නත්වලින් ගාලු දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ග්‍රාම නිලධාරී වසම් 02 ක් තෝරා ගෙන ඒවායේ අයට එන්නත ලබාදීමට තමයි යෝජනා වී තිබෙන්නෙ. ඒ අතරට අපගේ සභාවල හා ප්‍රථමයෙන් ප්‍රකාශ කල සේවකයින්ට. නිලධාරීන්ට සහ ග්‍රාමීය කමිටු නිලධාරීන්ට එන්නත ලබා දීමටත්, ඒ අනුව අප බල ප්‍රදේශයේ කොවිඩ් වඩාත් බලපාපු ග්‍රාම නිලධාරී වසම් 02 ක් වන මාපලගම පරණතානායම්ගොඩ සහ කැප්පිටියගොඩ උතුර තෝරාගෙන ඒ බව මා හට දැණුම් දීම කළා. ඊට පසුව එන්නත දීම සිදු කර ස්ථාන සකස් කිරීමට සභාවේ සේවකයන් ලබා දෙන ලෙස මගෙන් ඉල්ලීමක් කළා. මම ඒ ඉල්ලීම ඉටු කළා. ඒ අතර, මම විශේෂ ඉල්ලීමකුත් කළා. අපේ සභා සේවකයන් සහ නිලධාරීන්ගේ එන්නත් ලබාදීමට මුලික කර දෙන්න කියලා. මම එසේ ප්‍රකාශ කලේ, එදින එන්නත ලබා දෙන්නේ එම ග්‍රාම නිලධාරී වසම් දෙකේ අයට පමණක් කියා දැනුවත් වූ නිසයි. ඒ අනුව එන්නත් දීම කල පළමු දිනයේ,

නාගොඩ රාජකීය විද්‍යාලේදී අප සභාවේ සිටි සියළු සේවකයන්ට සහ නිලධාරීන්ට එන්නත ලබා දීම සිදු කළා. පසු දින නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සභා සේවකයන්ට, ග්‍රාමීය කමිටු නිලධාරීන්ට, පොලිස් නිලධාරීන්ට සහ මන්ත්‍රීවරුනට එන්නත ලබා දීම කරන නිසා මමද මෙදින එන්නත ලබා නොගෙන සිටින විට වෛද්‍ය අධිකාරීතුමාම මට කීවා සභාපතිතුමා අද එන්නත ලබාගන්න කියලා, කාඩ් එකකුත් ලබා දුන්නා. පසුව මම එම කාඩ් එක අතේ තියාගෙන ඉන්නකොට අපේ සේවකයකුට එන්නත ලබා ගැනීමට නොහැකි වූ බව මා සමඟ පැවසූ නිසා මගේ කාඩ්පත ඔහුට ලබා දී එන්නත ඔහුට විද ගැනීමට ඉඩ සැළැස්වුවා. පසුව මම එන්නත් දීම අවසන් වන අවස්ථාවේ එම ස්ථානයේ දිසාපතිතුමියත්. වෛද්‍ය අධිකාරීතුමත් ඉන්නවා දැකලා ඔවුන් සමඟ සුහදව කතා කරමින්, අද දින වැඩපිළිවෙල හොඳින් සිදු වුනා නේද කියලා අසන විට, දිසාපතිතුමිය කීවා සභාපතිතුමා එන්නත විදගත්තෙ නැහැ නේද කියලා. එය ඇසුනු වෛද්‍ය අධිකාරීතුමා මගෙන් විමසුවා ඇයි මම කාඩ් එකක් දුන්නා නේද කියලා. එවිට දිසාපතිතුමිය කීවා සභාපතිතුමා එය සභා සේවකයකුට දුන්නා කියලා. පසුව මමද අවසානයට එන්නත ලබා ගත්තා. මම එන්නත නොගෙන සිටියේ  පසුවදා අප වෙනුවෙන් අවස්ථාව තියෙන නිසා.

පසු දින එන්නත ලබා දීම සිදු කරන්නේ දිසාපති කාර්යාලයේ බැවින් ඒ පිළිබඳව මන්ත්‍රීවරුන් සහ එදින එන්නත ලබා ගැනීමට නොහැකි වූ නිලධාරීන්ට සභා ලේකම්තුමිය මාර්ගයෙන් දැණුම්දීම කළා. නමුත් මම පසු දින සභාවට ආ පසු අද මන්ත්‍රීවරුන්ට එන්නත ලබා නොදෙන බව සභා ලේකම්තුමිය කීවා. මම කීවා ඒක වෙන්න බැහැ. ඇයි එහෙම කියන්නෙ කියලා. එවිට ඇය කීවා. සහබන්දු මන්ත්‍රීතුමාත් එන්නත ලබා නොගෙන ගියා කියලා. මම මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්තුමියගෙන් දුරකථන මාර්ගයෙන් විමසුවා. එවිට එතුමිය ප්‍රකාශ කළා එතුමිය ළඟ තියෙන්නේ සභා කම්කරුවන්ගේ නම් ලිස්ට් එක විතරයි. මන්ත්‍රීවරුන්ගේ නම් ලිස්ට් එකයි, සභා නිලධාරියෙකුයි ඉක්මනට එවන්න කියලා. එවිට මම කිව්වා. ඊයෙ සම්පූර්ණ නම් ලිස්ට් එක MOH ට දුන්නා. එය රැගෙන ගොස් තමයි එන්නත් ප්‍රමාණය ගෙනාවෙ කියලා,   MOH කිව්වා කියලා. කොහොම නමුත් කොතනක හෝ අතපසුවීමක් සිදු ව ඇති නිසා මම අපේ ලේකම්තුමියගෙන් නම් ලිස්ට් එකක් ඉල්ලගෙන, එන්නත් කරන දිසාපති කාර්යාලයට යැව්වා. ඊට පසුව මමද එම ස්ථානයට ගොස් විස්තර විමසන විට මට තේරුම් ගියා අපේ මන්ත්‍රීවරු දෙපලක් යම් කිසි අපහසුතාවයකට පත් වී ඇති බව.  අපිට අපේ මහජන නියෝජිතයාට ගරුත්වයක් ඇතුව එන්නත ලබා ගැනීමට අවස්ථාව සළසා දීමට නොහැකි වීම පිළිබඳව මම කණගාටු වුණා. මම එම අවස්ථාවේ එතන සිටියානම්, කරුණු පහදා දී අවශ්‍ය එන්නත් ලබාගැනීම සිදු කර ගැනීමට තිබුණා කියලා පසුව සිතුණා. මම එතනට ගියාට පසු පෙර දින එන්නත් ලබා ගැනීමට නොහැකි වූ කැප්පිටියාගොඩ කිහිප දෙනෙකුට එන්නත ලබා දීම සිදු කළා. ඔවුනට පෙර දින අපි කීවා පසු දින එන්නත ලබා දෙනවා එදිනට එන්න කියලා. ඒ අනුවයි ඔවුනට එන්නත ලබා ගැනීමට හැකි වුනේ. ධනංජය මන්ත්‍රීතුමාගේ මවටද එන්නත ලබා නොදීම පිළිබඳවත් මම කතා කළා. නමුත් මේ කටයුතු සම්බන්ධීකරණයේදී යම් යම් අඩුපාඩුකම් සිදු වී ඇති බව පෙනී ගිය මුත්, ඒ පිළිබඳව වඩාත් කතා කිරීමට නොගියේ, මේ කාල වකවානුවේ සෞඛ්‍ය නිලධාරීන් කරන කාර්යයන් අගය කිරීමක් කරනු විනා, අඩුපාඩු සෙවීම නොකල යුතු නිසාත්ය. මන්ද අපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වඩාත් ආපදාවන්ට ලක් ව ඇති මොහොතක, විශේෂයෙන් පසුගියදා ගංවතුර ආපදාව සහ කොවිඩ් වසංගත තත්වය හමුවේ ප්‍රාදේශීය දිසාපතිතුමිය ඇතුළු සියළුම ග්‍රාම නිලධාරීන් ඇතුළු රාජ්‍ය නිලධාරීන්, වෛද්‍ය අධිකාරීතුමා ඇතුළු මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුද දිවා රාත්‍රී නොබලා තම රාජකාරිය සිදු කල ආකාරය මම පෞද්ගලිකව දන්නා නිසා ඒ පිළිබඳව ඔවුන්ට ගෞරවය පුදකරන ගමන්, සහබන්දු ගරු මන්ත්‍රීතුමාට යම් අපහසුතාවයකට පත්වීමට සිදු වීම පිළිබඳව මා පෞද්ගලිකවත් කණගාටු වෙනවා. ප්‍රාදේශීය ලේකම්තුමියත්, එම අවස්ථාවේ අපහසුතාවයකට පත්වන්න ඇති කියා මම සිතනවා. ඒ පිළිබඳව මීට වඩා යමක් ප්‍රකාශ කිරීම මින් නතර කරමින්, අද දින සභාව පැය භාගයකට සීමා වුවත්, ඊට වඩා කාලයක් සභාව පවත්වා ගැනීමට සිදු වූයේ, සහබන්දු මන්ත්‍රීතුමාගේ විශේෂ ප්‍රකාශය නිසා බවත්, අද

දින සභාවට නොපැමිණි මේ දිනවල නිරෝධායනය වෙමින් සිටින ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මන්ත්‍රීතුමියගේ සහ අද දින සභාවට නොපැමිණි ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා. නිශාන්ත නන්දන මන්ත්‍රීතුමාගේත් නිවාඩු අනුමත කරන ගමන්, පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලාත්. මන්ත්‍රීතුමියන්ලා සියළු දෙනාට ස්තූතිවන්ත වෙමින්, සභාව මෙයින් අවසන් කරනවා.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:-